# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2333/13 - 2023 මැයි මස 22 වැනි සඳුදා - 2023.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, එකී මණ්ඩලයට හක්මන ජල සම්පාදන ක්‍රමය යටතේ නිෂ්පාදන නල ළිඳක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/MH/533.
2023 මැයි මස 15 වැනි දින,
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

1A - G 39569 — 09 (2023/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

මාතර දිස්ත්‍රික්කයේ, හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 293 B මුරුතාමුරය බටහිර ග්‍රාම නිලධාරී වසමේ මුරුතමුරේ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ජී. උපුල් මහතා විසින් සකස් කරන ලද අංක 089 හා 2021.02.26 දිනැති පිඹුරුපතේ කැබලි අංක 1A දරන ඉඩම් කොටසේ පෙන්නුම් කෙරෙන හෙක්ටයාර් 0.0132 (පර්චස් 5.2) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ පතිරණගෙදිවෙල නොහොත් මලපලාව නැමති ඉඩම් කොටස,

| | | |
|---|---|---|
| *උතුරට* | - | ගමගෙදිවෙල නැමැති ඉඩම් කොටස; |
| *නැගෙනහිරට* | - | ගමගෙදිවෙල නැමැති ඉඩම් කොටස සහ අ.ග.පි 185 හි කැබලි අංක 227 දරන ඉඩම් කොටස; |
| *දකුණට* | - | අ.ග.පි 185 හි කැබලි අංක 227 හා 228 දරන ඉඩම් කොටස් දෙක සහ සැලසුම් අංක 940510 හි කැබලි අංක 02; |
| *බටහිරට* | - | සැලසුම් අංක 940510 හි කැබලි අංක 02 සහ ප්‍රාදේශීය සභා පාර; |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. හේවා වෙලේගේ අනුර මහතා.
නොː 69,
ඇවරිවත්ත පාර,
වත්තල.

EOG 05-0207